**මඩුල්ල ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව දන්වමි.

## 1.5 <u>වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 <u>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ</u>

### 1.6.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කරන ලද රු. 22,151,766 ක් වූ කර්මාන්ත 03 ක වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | සභාව සතු වත්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කරන ලද කර්මාන්ත 02 ක නිමි වැඩ වටිනාකම රු. 1,893,480 ක් වුවත් එය රු. 1,179,454 ක් ලෙස රු. 714,026 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | සභාව සතු වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගන්නා ලද ලී බඩු හා කාර්යාලීය උපකරණ වටිනාකම රු. 1,101,612 ක් වුවත් එය රු. 950,379 ක් ලෙස රු. 151,233 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය තුල දී මිලදී ගන්නා ලද කාර්යාල කබඩ් 01 ක සහ අල්මාරි 01 ක වටිනාකම වූ රු. 46,799 ක් ලී බඩු උපකරණ යටතේ සහ කාර්යාල උපකරණ යටතේ ගිණුම් ගතකර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ගණුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදාහනාගාරයේ පැවති රු. 36,231 ක් වූ ගෑස් තොග වටිනාකම ඉතිරි තොග ශේෂයට ඇතුලත් කර නොතිබුණි. | ඉදිරියේදී එම තොග ශේෂය නිවැරදිව තොග ලේඛනවලට ඇතුලත් කරන බව. | අවසන් තොගය නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල ගබඩා තොගය රු. 364,210 ක් වුවත් එය රු. 513,400 ක් ලෙස රු. 149,190 ක් වැඩියෙන් ඉතිරි තොගය තුල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | අවසන් තොගය නිවැරදිව ගණනය කළ යුතුය. |
| (උ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 4,268,145 ක් වුවත් එය රු. 4,170,085 ක් ලෙස රු. 98,060 ක් අඩුවෙන් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ හා දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 4,734,211 ක් වුවත් එය රු. 4,634,211 ක් ලෙස රු. 100,000 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඍ) සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය සඳහා ලද රු. 27,657,162 ක් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ ප්‍රාග්ධන ලැබීම් යටතේ දක්වා නොතිබුණු අතර ඉන් දරන ලද රු. 28,400,126 ක වියදම මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු. 174,335 ක් වූ හිඟ කඩ කුලී දඩ ගිණුම්ගතකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වියදම් ණයහිමියන් සහ කර්මාන්ත ණයහිමියන් වෙනුවෙන් පිළිවෙලින් ගෙවිය යුතු රු. 62,132 ක් හා රු. 234,055 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.6.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------------- | ---------------------------- | ---------------- |
| එකතු වටිනාකම රු. 263,901,547 ක් වූ වත්කම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු, වෘත්තීය තක්සේරුකරු වාර්තා සහ ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | සියලු ඉඩම් තක්සේරු කර ගැනීමට හා ඉඩම්වලට අදාල හිමිකම් ඔප්පු ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | පැවැත්ම තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.7 <u>අනුකූල නොවීම්</u>**

**<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ | | | |
| (i) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක ඉක්ම වූ රු. 95,000 ක තැන්පත් ශේෂ 03 ක් නියාදනය කර නොතිබුණි. | 2024 වර්ෂයේදී මෙම ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 83(1) වගන්තිය | 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 106 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම කටයුතු විධිමත්ව සිදු කරන බව. | සභා බලප්‍රදේශයේ ඉදිකරනු ලබන ගොඩනැගිලි සම්බන්ධයෙන් නියාමනය කළ යුතුය. |

**2. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,961,436 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 3,002,306 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| (i) | වරිපනම් හා බදු | 575,000 | 202,200 | 202,200 | - | 194,400 | 226,500 | 226,500 | - |
| (ii) | කුලී | 13,965,673 | 12,780,240 | 12,291,990 | 488,250 | 6,658,931 | 7,048,711 | 6,643,167 | 405,544 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 760,060 | 373,767 | 465,250 | - | 699,400 | 254,027 | 255,176 | - |
| (iv) | වෙනත් ආදායම් | 16,729,790 | 10,634,696 | 6,009,254 | 4,625,442 | 15,266,900 | 10,851,502 | 7,969,816 | 2,881,685 |
| | එකතුව | 32,030,523 | 23,990,903 | 18,968,694 | 5,113,692 | 22,819,631 | 18,380,740 | 15,094,659 | 3,287,229 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු** | | |
| ඉකුත් වර්ෂයට අදාලව සභාව සතු දේපල 03 ක් බදුදීම වෙනුවෙන් අයවිය යුතුව පවතින රු. 89,830 ක කුලී ආදායම අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් රැස්කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් රැස්කරගත යුතුය. |

**කුලී**

| | | |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 434,900 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් රු. 239,500 ක් හෙවත් සියයට 55 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් රැස්කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් රැස්කරගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 317,912 ක හිඟ කඩ කාමර කුලී ආදායමින් රු. 263,962 ක් හෙවත් සියයට 83 ක් සමාලෝචිත වර්ෂයේ දී අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් රැස්කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් රැස්කරගත යුතුය. |

**බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු කඩකාමර 23 ක් මාසික කුලී පදනම මත බදු දී තිබුණු අතර එම කඩ කාමර සඳහා වෙළඳ බලපත්‍ර හෝ ව්‍යාපාර බදු අයකර නොතිබුණි. | 2024 වර්ෂයේදී මෙම කටයුතු නිවැරදි කරන බව. | වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම හා ව්‍යාපාර බදු අය කිරීම විධිමත් විය යුතුය. |

**වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| (අ) 2019 – 2023 කාල පරිච්ඡේදයට අදාලව ජල පාරිභෝගිකයින් 173 ක ගෙන් අයවිය යුතු රු. 468,037 ක හිඟ ජල ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් රැස්කරගත යුතුය. |
| (ආ) 2017 – 2022 කාල පරිච්ඡේදයට අදාලව වාහන හා යන්ත්‍රෝපකරණ කුලියටදීම වෙනුවෙන් අයවිය යුතු රු. 1,392,360 ක හිඟ කුලී ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් කඩිනමින් රැස්කරගත යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 104,375 ක් සහ මුද්දර ගාස්තු රු. 4,636,150 ක් ගෙන්වාගෙන නොතිබුණි. | මෙම මුදල කඩිනමින් අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් රැස්කරගත යුතුය. |

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>** | | |
| 2022 නොවැම්බර් 25 දිනැති අංක 2308 දරන ගැසට් පත්‍රය මගින් නෙළුම් වැව බෝට්ටු සේවය , ළමා උද්‍යානය හා ත්‍රීවිල් රථාංගනයන් සඳහා ගාස්තු අයකරන බව දක්වා තිබුණද ඊට අදාළ අතුරු ව්‍යවස්ථා සකස්කර ගැනීම හෝ පවතින අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා සකස් කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ගාස්තු අයකර ගත යුතුය. |
| **(ආ) <u>ජල ව්‍යාපෘති</u>** | | |
| කහගොල්ල බුලත්වැල් ආර සහ මාගන්දාඔය හැකිරිල්ල ජල ව්‍යාපෘතිවල ජලය පිරිපහදු කිරීමක් හෝ ක්ලෝරීන්කරණය කිරීමක් හෝ සිදු කරනු නොලැබෙන අතර 2020 දෙසැම්බර් 31 දිනෙන් පසුව ජල සාම්පල් පිළිබඳ තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන නොතිබුණි. | ජල සාම්පල් පරීක්ෂා කිරීම හා ක්ලෝරීන්කරණය සඳහා මේ වන විට අවශ්‍ය පියවර ගනිමින් පවතින බව. | බලප්‍රදේශයේ මහජන සෞඛ්‍ය කටයුතු පිළිබඳ අවධානය යොමුකළ යුතුය. |

(ඇ) **<u>ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය</u>**

| | | | |
|---|---|---|---|
| (i) | නව කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා මොනරාගල අඩවියේ ගල්බොක්ක වන රක්ෂිතයට අයත් ලුණුතිබ්බාහෙල වනාන්තරයේ කිරිඇල්ල නම් ස්ථානයේ අක්කර 02 ක ඉඩම් කොටසක් තෝරාගෙන රු. 595,977 ක මුදලක් වැයකර ප්‍රවේශ මාර්ගයක් ඉදිකර තිබුණද එම ඉඩම සභාව වෙත පවරාගෙන කොම්පෝස්ට් ව්‍යාපෘතිය ආරම්භකර නොතිබුණි. | මේ වන විට අදාල ඉඩම පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර ඉදිරියේදී කොම්පෝස්ට් ව්‍යාපෘතිය ආරම්භ කොට මෙම ප්‍රවේශ මාර්ගය භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. |
| (ii) | ප්‍රාදේශීය සභාව විසින් ඝන අපද්‍රව්‍ය ඒකකය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | කඩිනමින් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට පියවර ගන්නා බව. | ඝන අපද්‍රව්‍ය ඒකකය සඳහා පරිසර බලපත්‍රය ලබාගත යුතුය. |

(ඇ) **<u>පරිසර ආරක්ෂණ බලපත්‍ර</u>**

| | | |
|---|---|---|
| සභාව විසින් ලබාදී තිබුණු පාරිසරික ආරක්ෂණ බලපත්‍රවල වලංගු කාලය ඉකුත් වී තිබුණු බලපත්‍ර 04 ක් අලුත් නොකිරීම සහ සමාලෝචිත වර්ෂයට අදාලව හඳුනා ගන්නා ලද කර්මාන්ත 08 ක් සඳහා බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු. 48,000 ක ආදායමක් අහිමි වී තිබුණි. එසේම බලප්‍රදේශයේ පවත්නා කර්මාන්ත නියාමනය කෙරෙහි සභාවේ අවධානය යොමු කර නොතිබුණි. | මෙම කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණ කටයුතු සහ බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතින බව. | බලප්‍රදේශයේ පවත්නා කර්මාන්ත නියාමනය කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | -------------------- | ----------------- |
| වාහන 03 කට සිදු වූ අනතුරු 04 කට අදාලව සිදු කරන ලද අලුත්වැඩියාවන් සඳහා වැය වූ රු. 83,130 ක මුදල වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රක්ෂණ ආයතනය විසින් සම්පූර්ණ රක්ෂණ මුදල ලබා නොදීම හේතුවෙන් ඉතිරි මුදල සභා අරමුදලින් ගෙවීමට සිදු වූ බව. | සභාව සතු දේපලවලට හානි වූ විට අලාභය අදාල පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | -------------------- | ----------------- |
| (අ) ප්‍රාදේශීය සභාව විසින් 2021 මැයි මාසයේදී දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන තිබුණද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය අනුව වරිපනම් බදු තක්සේරුකරගෙන බදු අයකිරීම 2024 පෙබරවාරි අවසන් වන විටත් සිදුකර නොතිබුණි. | මෙම කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන බව. | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකළ යුතුය. |
| (ආ) මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් කඩ කාමර බදුදීමට අදාලව නිකුත් කරනු ලැබූ ලංසු ප්‍රදානය කිරීමේ ලිපිය අනුව ආපසු නොගෙවන අත්තිකාරම් මුදල වසර 05 ක කාල සිමාවකදී මාසික වාරික වශයෙන් ගෙවිය යුතු බව සඳහන් වුවද සභාවට අයත් කඩ කාමර 14 කින් රු.1,734,997 ක මුදලක් මාස 01 සිට මාස 27 දක්වා කාලයක් අය නොවී පැවතුණි. | අදාල හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කුලී කඩිනමින් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු නව බස් නැවතුම්පොළ කඩ කාමර 02 ක් ගිවිසුම්ගත විමකින් තොරව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සහ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා ලබාදී තිබුණි. මෙම කඩ කාමරයක මාසික තක්සේරු කුලිය රු. 1,200 ක් වූ අතර 2023 අගෝස්තු මාසය වන විට රු. 156,000 ක කුලී ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නො තිබුණි. | මෙම මුදල් අයකර ගැනීම සඳහා අදාල පාර්ශවයන් දැනුවත්කර ඇති අතර කඩිනමින් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව . | හිඟ කුලී කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු නව බස් නැවතුම්පොළෙහි පිහිටි කඩ කාමර 04 ක් 2016 වර්ෂයෙන් පසු බදු දී නොතිබුණි. | බදු දීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරන බව. | කඩ කාමර බදුදී බදු ආදායම් රැස්කර ගත යුතුය. |
| (ඉ) මකුල්ල පැරණි බස් නැවතුම්පොල බිම් මහල කඩ කාමරයක් බදුගත් බදුකරු කඩ කාමර ලබාගැනීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර මහ සභාවේ එකඟතාවය මත වෙනත් අයෙකු සමග ගිවිසුම්වලට එළඹ තිබුණි. පැරණි බදුකරුගේ ටෙන්ඩර් ඇප තැන්පත් මුදල සභා ආදායමට බැරකර නොතිබුණු අතර නව බදුකරුගෙන් ගිවිසුම් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල බදුකරුගෙන් ගිවිසුම් ඇප තැන්පතු හා ටෙන්ඩර් ඇප තැන්පතු අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු දේපල බදු දීමේදී අදාල කටයුතු විධිමත්ව සිදුකළ යුතුය. |
| (ඊ) ප්‍රාදේශීය සභාවට අයත් මකුල්ල පැරණි බස්නැවතුම්පොල උඩුමහල කඩ කාමරයක් බදුගත් බදුකරු මහා සභාවේ එකඟතාවය මත වෙනත් බදුකරුවෙකුට පැවරීමක් කර තිබුණද නව බදුකරු සමඟ ගිවිසුම්ගත වීමට ගිවිසුම් ඇප තැන්පත් ලබා ගැනීමට සහ පැවරීමට අදාල ගාස්තු අය කිරිමට කටයුතු කර නොතිබුණි. | මෙම පැවරීමට අදාලව පැවරීම් ගාස්තු අයකර ගැනීමට සහ ගිවිසුම් ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු දේපල බදු දීමේදී අදාල කටයුතු විධිමත්ව සිදුකළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රාදේශීය සභාවට අයත් ශ්‍රවණාගාරයේ වැහි පිහිලි කිහිපයක් ගැලවී තිබුණු අතර බැල්කණියට පිවිසෙන පඩි පෙළට ඉහලින් පිහිටි සිවිලිම වර්ෂා ජලය කාන්දුවීම නිසා දිරාපත්වෙමින් පැවතුණි. | කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදුකරන බව. | අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |
| (ආ) දඹගල්ල පොලිස් නිල නිවාසයට යාබදව පිහිටි සභාවට අයත් පර්චර්ස් 20 ක ඉඩමේ බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් නිවසක් ඉදිකර එහි පදිංචි වී සිටින බව 2022 වර්ෂයේ විගණනයෙන් පෙන්වාදී තිබුණි. 2024 පෙබරවාරි වන විටත් එම ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට මෙම ඉඩම සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගත යුතුය. |
| (ඇ) සභාවට අයත් ඉඩමක් ලෙස ලේඛනවල සඳහන් සංචාරක නිවාසය ඉදිකර ඇති ඉඩමේ නීත්‍යානුකූල අයිතිය 2024 පෙබරවාරි 14 දින වන විටත් සභාවට පවරාගෙන නොතිබුණු අතර ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීම සහ වැට සකස් කිරීමේ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට සැලසුම් කරන බව. | සභාව සතු දේපලවල නීත්‍යානුකූල අයිතිය සහ ආරක්ෂාව තහවුරුකර ගත යුතුය. |
| (ඈ) ඉගිනියාගල මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ කොටසක් ආවරණය කරමින් බාහිර පාර්ශවයන් විසින් ඉදිකර තිබුණු අනවසර ඉදිකිරීම 2024 පෙබරවාරි වන විටත් ඉවත්කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ගැටළුව විසඳීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල පියවර ගන්නා බව. | සභාව සතු දේපලවල ආරක්ෂාව තහවුරුකර ගත යුතුය. |
| (ඉ) නාගවිමන යාය සහ දැලිව යන සුසාන භූමි දෙකෙහි බාහිර පාර්ශවයන් විසින් සිදුකර තිබුණු අනවසර ඉදිකිරීම් 2024 පෙබරවාරි මාසය වන විටත් අනවසර ඉදිකිරීම් ඉවත්කර අදාල සුසානභූමිවල නීත්‍යානුකූල අයිතිය ප්‍රාදේශීය සභාවට පවරාගෙන නොතිබුණි. | ඉදිරියේදී මෙම ගැටළුව විසඳීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල පියවර ගන්නා බව. | සභාව සතු දේපලවල ආරක්ෂාව තහවුරුකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) කන්දකැටිය ප්‍රාදේශීය සභාවට අයත් මෝටර් ග්‍රේඩරයක් වසර 4 කට ආසන්න කාලයක සිට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා යොදාගනු ලබන අතර එය 2024 පෙබරවාරි මාසය වන විටත් සභාවට පවරාගෙන හෝ නැවත කන්දකැටිය ප්‍රාදේශීය සභාවට භාරදීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට මෙම යන්ත්‍රයේ අයිතිය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | සභාව සතු වත්කම්වල අයිතිය තහවුරු කරගත යුතුය. |
| (උ) සභාව සතු කැබ් රථයේ එන්ජින් අංකය සහ වාහන ලියාපදිංචි සහතිකයේ සඳහන් එන්ජින් අංකය අතර වෙනසක් පවතින බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් තව දුරටත් සොයා බලා අවශ්‍ය ඉදිරි පියවර ගන්නා බව. | සභාව සතු වාහනවල ලියාපදිංචි කටයුතු නිරවුල් විය යුතුය. |
| (ඌ) සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු මේවන විට සිදු කරමින් පවතින බව. | සභාව සතු වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |
| (එ) සභාවට අයත් පුස්තකාල 05 ක පාඨකයින්ට ලබාදී තිබුණු රු. 126,149 ක පුස්තකාල පොත් 466 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නැවත ලබාගෙන නොතිබුණි. | මෙම ගැටළුව විසඳීමට කඩිනම් පියවර ගන්නා බව. | පාඨකයින් වෙත ලබාදුන් පුස්තකාල පොත් නැවත ලබාගත යුතුය. |

### 3.5 <u>ප්‍රසම්පාදන කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------ | ---------------- |
| (අ) වල්කැපීමේ යන්ත්‍ර සඳහා තල මිලදී ගැනීමේදී අවම මිල ඉදිරිපත් කළ ආයතනය වෙනුවට වෙනත් ආයතනයක් වෙතින් මිලදී ගැනීම හේතුවෙන් සභා අරමුදලට රු. 16,200 ක පාඩුවක් සිදු වී තිබුණි. | අදාල පෞද්ගලික ආයතනය වෙතින් එම මුදල ඉදිරියේදී අයකර ගන්නා බව. | රජයට අවම අවාසියක් වන ආකාරයට ප්‍රසම්පාදනය කළ යුතුය. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව විවෘත මිල ගණන් කැඳවීමේදී පුවත්පත් දැන්වීම් පල කරනු ලබන අතර සභාවේ දේපල බදුදීම සඳහා මිල ගණන් කැඳවීමේදී මොනරාගල දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ස්වේච්ඡා සංවිධාන හෝ ස්ථිර පදිංචි පුද්ගලික ලියාපදිංචි | ඉදිරියේදී මෙම කටයුතු නිවැරදිව සිදු කිරීමට පියවර ගන්නා බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව සිදු කළ යුතුය. |

කරුවන්ට පමණක් සීමා කරමින් දැන්වීම් පලකර තිබුණි. ඒ හේතුවෙන් ඒ සඳහා වැයකර තිබුණු රු. 19,795 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 03 ක සේවකයින් 04 දෙනෙකුගේ ඌනතාවයක් හා තනතුරු 03 ක සේවකයින් 17 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණකර ගත යුතු අතර අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරවා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 08 ක සියයට 02 සිට සියයට 98 දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 08 සිට සියයට 98 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිසි පරිදි අයවැය සකස් කිරීමට පියවර ගන්නා බව. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.2 <u>පාරිසරික ගැටළු</u>

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ----------------------- | ---------------------------- | ---------------- |
| ඝන අපද්‍රව්‍ය ඒකකයේ ආරක්ෂාව තහවුරු වන පරිදි ආරක්ෂිත වැටක් ඉදිකර නොමැතිවීම හේතුවෙන් බාහිර පාර්ශවයන් විසින් විවිධ කසල එම ස්ථානයට බැහැරකිරීම් සිදුකර තිබුණි. | ඝන අපද්‍රව්‍ය ඒකකය සඳහා ආරක්ෂිත වැටක් කඩිනමින් සකස් කිරීමට පියවර ගන්නා බව. | කසල කළමනාකරණ කටයුතු විධිමත්ව සිදුකළ යුතුය. |